# තනතුරු ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වලට අභ්‍යන්තර බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුගත සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2026.04.30 දිනට පෙර ඉදිරිපත් කල යුතුය.

| අනු අංකය | තනතුරු නාමය | ශ්‍රේණිය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01 | ආදායම් පරීක්ෂක | III | 02 | MN 1-2025 (රු. 45230-10x540-11x630-10x890-10x1190-78360/- වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 45230/=, 3 වන වැටුප් තලයට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. |

**අධ්‍යාපන සුදුසුකම් :-** අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

**පළපුරුද්ද :-** අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**කායික සුදුසුකම් :-** තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**වෙනත් :-**

i. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.

**වයස :-** අවම සීමාව - / උපරිම සීමාව - } දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ස්ථිර සේවකයන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාල නොවේ.

**තනතුරේ ස්වභාවය :-** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

- පත්වීම් ලබා වසර 05 ක් ඉක්මවීමට පෙර අංක 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**බඳවා ගැනීම ක්‍රමය:-**

01. **ලිඛිත විභාගය**

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාල දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

02. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

**විභාගය සඳහා වන විෂය නිර්දේශය :-**

| ප්‍රශ්න පත්‍රෙය් නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | • මහා නගර සභා අඥා පනත, නගර සභා අඥා පනත හා ප්‍රාදේශීය සභා පනත මගින් ආදායම් එක් රැස් කිරීම පිළිබඳව පැවරී ඇති බලතල.<br>• පළාත් පාලන ආයතනයක ඇති ආදායම් උත්පාදන ප්‍රභවයන්.<br>• කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු, පැනවීම හා එක් රැස් කිරීම, නොගෙවන අවස්ථාවලදී නීතිමය කටයුතු කිරීම.<br>• අයවැය ඇස්තමේන්තු සැකසීමේදී ආදායම් පරීක්ෂකගේ දායකත්වය.<br>• වරිපනම් බදු, අක්කර බදු පැනවීම, දැන්වීම් නිකුත් කිරීම, අධි ගාස්තු පැනවීම, වට්ටම් ලබා දීම ආදිය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසිකොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**
**මීගමුව මහා නගර සභාව**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදායම් පරීක්ෂක III තනතුර සඳහා අයදුම් පත්‍රය.**

1. මුලකුරු සමඟ නම :-
2. සම්පූර්ණ නම :-
3. ජාතික හැඳුනුම්පත් අංකය :-
4. ස්ථිර පදිංචි ලිපිනය :-
5. තැපැල් ලිපිනය :-
6. දැනට දරන තනතුර :-
7. දැනට සේවය කරනු ලබන දෙපාර්තමේන්තුව :-
8. දුරකථන අංකය :-
9. උපන් දිනය :-
10. 2026.01.01 දිනට වයස :-
11. අයදුම්පත් කැඳවන දිනට මීගමුව මහා නගර සභාවේ සේවා කාලය :-
12. අධ්‍යාපන සුදුසුකම් :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
13. පළපුරුද්ද :-
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග :-

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත් වන බව හොඳාකාරවම දනිමි.

.................................................

දිනය :- අයදුම්කරුගේ අත්සන

**අංශ ප්‍රධානියගේ නිර්දේශය**

ඉල්ලුම්කරු වන ............................................................. මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු / ඇය දනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකිය. / නොහැකිය. ඔහු / ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

......................................

අංශ ප්‍රධානියාගේ අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතික**

මෙම ඉල්ලුම්කරු වන ...................................................................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු / ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කල හැකිය / නොහැකිය. ඔහු / ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.......................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම :-

තනතුර :-

දිනය :-